# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

ආර්.ඒ රත්නදාස
26, මාරපොල,
වේයන්ගොඩ

<u>අභියාචක</u>

**අභියාචනා අංකය : 446/2022**

එදිරිව

බස්නාහිර පළාත ආණ්ඩුකාර
ලේකම් කාර්යාලය
204,10 වන මහල
ඩෙන්සිල් කොබ්බෑකඩුව
මාවත
බත්තරමුල්ල

<u>පොදු අධිකාරිය</u>

**ඉදිරිපිටදී** :

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** :

අභියාචක දු:ක අංක 033 2289092 ඔස්සේ සම්බන්ධ වේ.

පොදු අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීමක් නැත.

**ලිඛිත සැළකිරීම්** :

අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත

**විභාග කළ දිනය** : 2022.07.28

**තීරණය කළ දිනය** : 2022.07.28

**<u>කොමිෂන් සභාවේ තීරණය</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2021.11.08 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

> ***<u>2016 අංක 12 දරන තොරතුරු පනත ප්‍රකාරව තොරතුරු ඉල්ලා සිටිමි.</u>***
>
> *ඔබේ අංක GOS/AND/09/27 හා 2021.07.30 දිනති ලිපිය හා බැඳේ.*
>
> *මා විසින් ඔබ වෙත එවන ලද 'බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ සහ නිලධාරීන්ගේ වගකීම පැහැර හැරීම ' යන ලිපිය සම්බන්ධයෙනි.*

*මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් කරන ලද විමර්ශනයේ තොරතුරු මා වෙත දන්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.*

තොරතුරු නිලධාරී විසින් පනතේ දක්වා ඇති නියමිත කාල සීමාවන් තුල ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීම මත අභියාචක විසින් 2021.11.26 දින නම් කළ නිලධාරි වෙත අභියාචනයක් සිදු කර ඇත.නම්කළ නිලධාරිද නියමිත කාලය තුළ ප්රතිචාර දැක්වීමට අපොහොසත්වීම මත අභියාචක විසින් 2022.01.14 දිනැතිව කොමිෂන් සභාවට ඉහත අංක දරණ අභියාචනය යොමු ඇත.

**සළකා බැලීම**

මෙම අභියාචනයට අදාළ තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ අභියාචනයට නම් කළ නිලධාරි විසින් නිසි පරිදි තීරණයක් ලබා දී නොමැත. ඒ සඳහා පැහැදිලි හේතු දැක්වීමක්ද නම් කළ නිලධාරි විසින් සිදු කර නොමැත. ඉහත සඳහන් තොරතුරු ඉල්ලීම පරීක්ෂා කර බැලීමේදී පැහැදිලිව පෙනී යන්නේ එකී තොරතුරු කිසිදු බාධාවකින් තොරව අභියාචක වෙත ලබා දීමට පොදු අධිකාරියට හැකියාව ඇති බවය.

එබැවින් මෙම කරුණු සළකා බලා උක්ත සඳහන් තොරතුරු ඉල්ලීමෙන් අයැද ඇති පරිදි එකී තොරතුරු ඉල්ලීමේ අඩංගු සියලු තොරතුරු 2022.08.25 දිනට ප්‍රථම, කොමිෂන් සභාවට පිටපත් සහිතව, අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.